## කවි කොළය



# බලු පොරය ඇරඹේ!

ඇසුණාද? ඔබට මහ ජන්දයෙ අඬ බෙරය
එය ගිය වසරෙ සිට ඇරඹුණ පෙර හැරය
ගනු වස් තුනෙන් දෙක ඉහළම ජන වරය
ඇරඹී තිබේ දෙස්පාලන බලු පොරය

ජනපතිතුමන් දුන් වැදගත් අව වාද
කැඩුවා පසු දිනම අනුගාමික යාද
ජන්දය දිනා හතරක් ඇති අය පාද
මෙවරත් එසේ නම් මැති සබයට ඒද?

දක්වයි වැසුණු සුද ඉගිලෙන විටදි කොකා
සිල් රෙදි හතක් පොරවා එයි දරුණු යකා
නීතිය විනය නොතකන රට නහන එකා
පලවා හැරිය යුතුවෙයි ජන්දයෙදි මකා

ඇත මතුවටත් පාඩම් අප උගත මනා
නොබලා පැහැය තෝරා නිසි සුදුසු කෙනා
දෙදහස් දහයෙ දෙන්නට මැති අසුන දිනා
මින් මතු සිතට ගතයුතු වෙයි සියළු දෙනා

මෙරටෙහි ජන්දදායකයා නැණ වත්ය
දෙස්පාලනය ගැන දැනුමෙන් පොහො සත්ය
ජන්දය සියල්ලට වැඩියෙන් බල වත්ය
මේවා මගෝඩිස්ලා පෙරළණ පොත්ය

පන්සල් ගොසින් රිංගයි පල්ලියට නබී
නළලේ අළු උළයි ගොස් කෝවිලට එබී
අත්තක සිවුරු පොරවා බෝධියද සිඹී
රජ කාලෙවත් මේ සෙල්ලම් නොමැත තිබී

වපුරන වේදිකාවල ගල් පැලෙන බොරු
වංචාවලට විනිමය පටලැවුණු හොරු
පර්මිට් කාර් විකුණන හාමුදුරු වරු
කෙළසා දමන්නෝ වෙති මැතිසබය ගරු

දෙවියන් විහිෂණ
පෙර කැළණිය බාර
අද නැත, මතුව
ඇත භීෂණ අව තාර
මැරවරයන්ට රට
වනසන කුඩු කාර
දෙන්නට නම් එපා
ජන්දය මේ පාර



♦ තලන්ගම ජයසිංහ
**Sri Lanka**

## ප්‍රභූ ආරක්ෂාවට හමුදා භටයන් නැත

යුද්ධය පවතින කාලයේ මැති ඇමතිවරුන් සහ ප්‍රභූන්ගේ ආරක්ෂාවට යුද හමුදා භටයන් යොදවා සිටි නමුත් නොබෝදා ආණ්ඩුව විසුරුවා හැරීමත් සමග ආරක්ෂක අමාත්‍යාංශය මගින් එය නවත්වා දමා ඒ වෙනුවට පොලිස් භටයන් දී තිබේ. මේ ගැන ඇතැම් මන්ත්‍රීවරු විරෝධය පළකරන අතර සමහරු මේ තීරණයට එරෙහිව උසාවි යන්නට ද සූදානම් වන බව අසන්නට ඇත.

# Eight-limbed boy desperate to get parasite twin removed

# ගාත්‍රා 8ක් ඇති ඉන්දියානු ළමයා

The parents of an Indian boy born with the arms, legs and buttocks of a parasitic twin protruding from his chest are searching for a doctor who can rid their son of the growing parasite.

Some people see eight-limbed Deepak Paswaan as the reincarnation of the Hindu god Lakshmi, but to others he is the devil.

The worshippers bring offerings of money and flower garlands to the seven-year-old in his village of Bihar, in north-east India, but the more sinister throw stones at the little boy in a bid to remove the devil from his tiny body.

"Every day I wish for a good doctor who could cure Deepak so he can live a normal life," said his father Veeresh Paswaan.

The legs of the parasitic twin have grown at the same rate as Deepak, meaning the youngster is now carrying around a heavy weight.

Further up Deepak's torso are the withered arms of the parasitic twin.

No X-rays or scans have been taken, so the internal effects of Deepak's condition are not yet known.

The boy's mother Indu, 28, and her husband earn less than £1 a day and cannot afford the expensive medical care needed to remove the extra limbs.

This is not the first case of a parasitic twin reported in Bihar.

In 2005 Lakshmi Tatma was born with a twin attached at her hips. Just like Deepak, she was worshipped as a incarnation of the multi-limbed Hindu goddess of wealth.

She shot to fame after Sharan Patil, a orthopaedic surgeon, performed a groundbreaking 27-hour operation to remove the twin. Lakshmi recovered , and is now walking and attending school.

Parasitic twins occur when the twin embryo does not fully separate in the womb. One twin becomes dominant at the expense of the other and the undeveloped twin becomes a parasite, completely dependent on the body functions of the living twin.





උතුරු ඉන්දියාවේ බිහාර් ප්‍රාන්තයේ ගමක ඉතා දිළිඳු පවුල කට පිරිමි ළමයෙකු උපන්නේ ඉතා අසාමාන්‍ය ලෙස පපුවෙන් නෙරා ආ වැඩිපුර අත් සහ පාද 4 ක් සමග ය. උත්පත්තියේදීම මිය යනු ඇතැයි වෛද්‍යවරු සිතුව ද ඔහු සාමාන්‍ය ළමයෙකු ලෙස වැඩුණේය. දැන් ඒ ළමයාගේ දෙමා පියෝ මේ වැඩිපුර අවයව සිරුරෙන් ඉවත් කරගන්නට වෛද්‍ය පිහිට සොයති.

ගමේ සමහර අය සිතන්නේ දීපක් පස්වාන් නමැති මේ ළමයා ධනයට අධිපති, අත් ගණනක් ඇති, ලක්ෂ්මී දෙවඟන විය හැකි බවය. එසේ සිතා ළමයා ළඟට ඔව්හු පූජාවට්ටි රැගෙන විත් වැඳ පුදා යති. එහෙත් ගමේ තවත් අය සිතන්නේ මේ ළමයා මිනිස් වෙසින් ආ යකෙකු බවයි. එබැවින් ඇතැම් අය ඒ යකා පළවා හරින්නට සිතා ළමයාට ගල් මුල්වලින් පහර දෙන බව දෙමාපියෝ පවසති.

"හැමදාම මම ප්‍රාර්ථනාකරන්නෙ දීපක් සනීප කරන්න පුළුවන් කවුරු හරි දොස්තර කෙනෙක් ලැබේවා කියලයි " ළමයාගේ පියා වන වීරේෂ් පස්වාන් කියයි. ළමයාගේ ඇඟේ වැඩී ඇති මෙම මිනිස් පිළිලය ළමයා සමගම දිනදින වැඩෙන බැවින් ඔහුට දැන් අමතර විශාල බරක් ද දරා සිටින් නට සිදුව ඇත.

එක්ස් රේ හෝ ස්කෑන් කිසිවක් කර නැති බැවින් ළමයාගේ ශරීරයේ අභ්‍යන්තරය කෙසේ සකස්වී ඇත්දැයි තවම කිසිවෙකු නොදනී.

ළමයා දැනට පාසැලට යන නමුත් ඉගෙනීමට දක්ෂ නමුත් අනෙක් ළමයින් හමුවේ ඔහු අපහසු තත්වයට ඉක්මණින් පත්වේ.

ළමයාගේ මව වන ඉන්දු (28) සහ ඇගේ සැමියා වීරේෂ් දවසකට උපයන්නේ පවුමකටක් (රු175) වඩා අඩු මුදලකි.. ඔවුන්ට අවයව ඉවත්කරන ශෛල්‍යකර්මයකට ගෙවන්නට මුදල් කොහෙත්ම නැත.

මෙවැනි අද්භූත උපතක් සිදුවූ ප්‍රථම වතාව මෙය නොවේ.

2005 දී ලක්ෂමී තත්මා නම් දැරිය උපන්නේ උකුලෙන් බද්ධ වූ තවත් ශරීරයක් ද සමගය. ඉහත සඳහන් දීපක් මෙන් මෙම දැරියද මිනිස් වෙසින් ආ ලක්ෂමී යයි සිතූ අවට ජනතාව ඇයට වැඳුම් පිදුම් කරන්නට වූහ. පැය 27ක ශල්‍යකර්මයකින් වෛද්‍යවරුන් අමතර අවයව ඉවත් කරන ලදුව දැරිය අද සාමාන්‍ය ජීවිතයක් ගත කරයි.

මෙවැනි උපතකට හේතුව කාන්තාවකගේ ගර්භාෂයේ ද්විත්ව කලලයක් ඇතිවී ඒ එකක් අනෙකේ සාරය උරා බී වැඩීමයි.



**ඉරිදා SUN** - ආතර් මාම ඊයෙ කතාකරපු වෙලාවෙ මෙහෙම කතාවක් කිව්වා. ජෙනරාල්තුමාට රාජ යෝගයක් තියනවයි, රටේ ජනාධිපතිකම අත උඩ ලැබෙන්න තියන වයි කියලා ලණුව දීපු සාස්තරකාරයා දැන් කියනවලු, මම රාජ යෝගයක් ගැන කිව්වෙ නැත, මම කිව්වෙ රාජ නියෝගයක් ළඟදිම එන්න පුළුවන් කියලයි, ඒක ඇහෙන්න ඇත්තෙ වැරදි විදියටය, මම තවදුරට තේරුම් කරලා දීලා ජෙනරාල්තුමාට ඉදිරියට එන්න තියන කර දර ගැනත් කියලා දෙන්නය ලැස්තිවුණේ, ඊට ඉස්සෙල්ලා ඒ කේන්දරේ ගෙනාපු කස්ටිය තැන්කියු තැන්කියු ගුරුන්නාන්සෙ, මේක දැනගත්තු එක කොච්චර දෙයක්ද? රාජ යෝගයක් තියනවනම් අම්මපා මොනව කරන්න බැරිද? එහෙනම් දැන්ම ලැස්තිවෙන්න ඕන කියලා කේන්දරෙත් අරගෙන දිව්වයි, ඉතින් ඒකට මං මක්කරන්නදැයි කියලා.

**සඳුදා MON** - කොටි සංවිධානෙ යුරෝපෙයි කැනඩාවෙයි ඉන්න කොටියො එකතුවෙලා දැන් විශ්ව දෙමළ එකමුතුව කියලා වෙන නමකින් සංවිධානයක් අටවගෙන, ආයිත් ලංකාවෙ වැඩවලට අතදාන්න බලනවා. කොහොම හරි ඊළම පිහිටවනවාමයි කියලා දිවුරනවා. මේ දෙමළ හාදයො කවදාවත් පාඩම් ඉගෙනගන්නෙ නැති ජාතියක්. ඊළම පිහිටුවන්න ගිහිං ගිය අවුරුද්දෙ මැයි මාසෙ වෙච්ච හරිය දැක්ක නේද? ප්‍රභාකරන් කියන ඒ මෝඩ මිනිහට තමන්ගෙ ජීවිතේ විතරක් නෙවෙයි, දරුවොයි, ගෑනියි ඇතුළු මුළු පවුලම නැතිවුණා. අනිත් නායකයන්ටත් වුණේ ඒකමයි. දෙමළ වර්ගයා අන්තිමට ලෝකෙටම එපාවෙච්ච මහා නරුමයො ජාතියක් වෙනවා. උන්ට ඒක තේරෙන්නෙ නැහැ. ඒක තමයි උන්ගෙ ගොන්කම.

**කුජදා TUE** - ගිය සුමානෙ අපි කොවෙන්ට්‍රි ගියා කමලා නැන්ද ලයි ගෙදර. ලොකු පුතා අජිත්ට මේ දවස්වල බඳින්න ගෑණු ළමයෙක් හොයනවා. කම්පියුටර් මූණු පොතෙන්, ඒ කියන්නෙ ෆේස්බුක් එකෙන් විවාහ යෝජනා හැටක් හැත්තෑවක් ඇවිල්ලා. ජර්මණියෙන්, කැනඩාවෙන්, සිංගප්පූරුවෙන්, ලංකාවෙන්. ලන්ඩන් වලිනුත් හතරක් ඇවිත්. කිට්ටුම ඒවා ලන්ඩන් නිසා දිනයක් නියම කරගෙන බලන්න ගිහිං. නැන්ද කියනවා ෆේස්බුක් එකේ පෙනිච්ච ලස්සන, උස, වයස ඒ ගෑණු ළමයින් හැබැහින් දැක්කම නැතිලු. ෆේස් බුක් කියන්නෙ මොන තරම් ප්‍රෝඩාවක්ද කියලා නැන්දා අහනවා. ඒ අතින් පරණ තාලෙ කපුවො ගෙනාපු විවාහ යෝජනා කොච්චර හොඳද? බඳින්න යන කෙනා හරිහැටි දකින්න පුළුවන්. අපේ දෙමව්පියො බැන්දෙත් කපුවෙක් ගෙනාපු යෝජනාවකින්.

**බුදදා WED** - දේශපාලකයට ඡන්දදායකයා ඕනවෙන්නෙ ඡන්දෙ කාලෙට විතරයි. ඒවගේම ඡන්දදායකයත් ඡන්දෙ කිට්ටු කරලා මන්ත්‍රීලාට බලපෑම් කරනවා අරක ඕන, මේක ඕන, නැත්නම් ඡන්දෙ දෙන්නෙ නෑ කියලා. හැම තැනම සිරිත දැන් ඒවිදියයි. ලංකාවෙ වගේම තව මාස කීපයකින් එංගලන්තෙ ඡන්දෙ. කොන්සර්වේටිව් සහ ලේබර් පක්ෂ දෙකට සුළු ජාති ගිහිං හේත්තු වෙන්න බලනවා. මේ මන්ත්‍රීවරුත් උන්ගෙ පස්සෙ යනවා. දෙමළ ඩයස්පෝරාවත් දැන් පක්ෂ දෙකම අල්ලගෙන. ඒ හේතුව නිසයි දැන් එංගලන්ත ආණ්ඩුව ලංකාවට පාට් දාන්නෙ, මේ දෙමළ ඡන්ද ටික ඩැහැගන්න.

**ගුරුදා THU** - ජනපතිවරණෙ ඉවරවුණු ගමන් විපක්ෂය කෝවිල කට ගිහිං ආණ්ඩුව වැටෙන්න කියලා පොල් ගැහුවයි කියලා පත්තරේක තිබුණා. තව කට්ටියක් ආණ්ඩුවට සෙත් පතලා වස් දොස් යන්න කියලා පොල් ගැහුවයි කියලා තව පත්තරේක තිබුණා. ඇත්තටම පොල් ගැහුවම ඔය කියන දේවල් සිද්ධ වෙනවද කියලා කවුරුවත් තවම දන්නෙ නෑ. මොනව හිතාගෙන ගහනවද කියලා ඒ ගහන අය විතරයි දන්නෙ. හැබැයි මෙතෙන්දි එක දෙයක් මට පේනවා. ඒ තමයි පොල්වලට කරන මහ අපරාදෙ. පොල්ගෙඩිය දවසින් දවස ගණන් යනවා. දවල්ට රෑට උයන්න ගෙදර පොල් නෑ. මේ ගොන් බාස්ලා ඒක පොළවෙ ගහලා විනාස කරනවා. මේ වගේ මිනිස්සුන්ට කියන්න ලංකාවෙම හොඳ නමකුත් හදලා තියනවා. ඒ තමයි පොල් බූරුවො.

**කිවිදා FRI** - ඔන්න ලංකාවෙ මහ ඡන්දෙ පටන්ගත්තා. අපේක්ෂකයො සේරම අත්දෙක උස්සගත්තු ගමන් ජනතාවට ආචාර කරනවා ඉවරයක් නෑ. කට කණ ළඟට ඉරෙන කල් දිග හිනාවක්. ඊළඟට ඒ ගොල්ල වැඩට බැහැලා ඉදිරියට කරන සංවර්ධන වැඩ ගැනමයි කියන්නෙ. ඒ කතා අහන් ඉන්න කොට පුදුම හිතෙනවා මෙච්චර දේශප්‍රේමී ගුණ යහපත් කස්ටියක් අපි නොදන්නවට ඉන්නවයි කියලා. ඒ පාර ඒ හැමෝම පන්සලට යනවා. වඳිනවා. පිරිත් නූල් ගැටගහ ගන්නවා. ඇඟිලි හරියෙ ඉඳලා වැළමිට ළඟට එනකල් වැහිලා පිරිත් නූල් වලින්ම. ඒ ගමන්ම කෝවිලට යනව. එතන පූසාරියටයි දෙවියන්ටයි දෙන්නටම වැඳලා, කපුරු පත්තුකරලා, නළලෙ අළු ගාගෙන එහෙම්ම පල්ලියට යනව. එතන සුරුවමට අත තියලා ඉඹලා, යාඥාකරලා පාදර්ගෙන් ආශිර්වාද අරගෙන, එහෙම්ම මුස්ලිම් පල්ලියට යනව, එතනත් ඔය මොනව මොනව හරි කරලා, කැමරාවට මූණ දෙනවා.